**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**(අ) ලැබිය යුතු ගිණුම්**

වර්ෂ 2 සිට වර්ෂ 25 දක්වා කාල පරාසයක පවතින ණයගැතියෝ රු.18,344,128 ක් අදාල ආයතනවලින් හෝ පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

2017 දෙසැම්බර් 31 දිනට රු.56,398,541 ක් වූ ගෙවිය යුතු ගිණුම් වලින් වර්ෂ 05 ට වැඩි කාලයක් තුල නොගෙවා තිබෙන රු.2,910,261 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 1.3.2 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | රු. | |
| (i) | 129 (2) (අ) සහ (ඊ) වගන්ති | 15,509,039 | සභාවට ලැබිය යුතු සියළුම බදුකුලී විධිමත් පරිදි අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) 136 වගන්තිය | - | සභා සීමාව තුල පිහිටි සභාවට අයත් බදු දෙන ලද හෝ කුලියට දෙන ලද සියළු ඉඩම් හා ගොඩනැගිලිවල බදුකරුවන්ගෙන් වරිපනම් බදු හෝ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) 158 වගන්තිය | 22,723,733 | සභා බල ප්‍රදේශයේ වරිපනම් හා අක්කර බදු ගෙවීම පැහැර හරින තැනැත්තන්ට අයත් චංචල දේපළ තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iv) 159 (1) වගන්තිය | 258,524 | සභාව විසින් කුලියට දී තිබෙන දේපලවලින් අයවියයුතු කුලිය අයකර ගැනීම සඳහා චංචල දේපල තහනමටගෙන ඉදිරි පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) අංක 10(2) රීතිය | - | එක් එක් ව්‍යාපෘති ආරම්භ කිරීම සහ අවසන් කිරීම සඳහා ඉලක්ක දිනයන් නියම කිරීමට සහ ඉලක්ක දිනයන්ට අනුකූලවන පරිදි එක් එක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගෙන නොතිබුණි. |
| (ii) අංක 33 රීතිය | - | වරිපනම් ගෙවීම් පැහැර හරින පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුවක් එක් එක් කාර්තු අවසානයේදී පිළියෙල කර නොතිබුණි. |
| (iii) අංක 213 රීතිය | 1,146,400 | නිකුත් කිරීමේ නියෝගයක් නොමැතිව කර්මාන්ත අංශය සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය නිකුත් කර තිබුණි. |
| (ඇ) 2015 මැයි 20 දිනැති අංක 2015/11 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 7 ජේදය | 698,650 | 2017 වර්ෂය සඳහා නිල ඇඳුම් දීමනාව සභාවේ නිලධාරීන්ට ගෙවා තිබූ නමුත් සභාවේ කිසිදු නිලධාරියෙකු හෝ සේවකයෙකු නියමිත නිල ඇඳුමින් සැරසී සේවය කර නොතිබුණි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.112,911,422 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.61,381,092 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

(අ). සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස් කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු '.000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 20,941 | 16,679 | 16,012 | 22,037 | 21,052 | 14,421 | 19,513 | 20,022 |
| (ii) | කුලී | 25,115 | 20,456 | 20,861 | 674 | 22,897 | 19,532 | 19,308 | 1,079 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,177 | 11,875 | 11,859 | 16 | 6,002 | 1,363 | 1,980 | - |
| (iv) | වෙනත් ආදායම් | 200,016 | 224,768 | 215,781 | 226,591 | 191,807 | 116,215 | 72,626 | 60,612 |

සටහන: රැස්කළ ආදායම තුල වර්ෂයේ බිල්කළ ආදායමෙන් අයකිරීම් සහ හිඟහිටි ආදායමෙන් අයකිරීම් ඇතුළත් වේ.

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂයේදී බිල්කළ සහ පසුගිය වර්ෂවලට අදාලව අයවිය යුතුව තිබුණු වරිපනම් හා බදු ආදායමෙන් සියයට 16 ක්ද, කුලී ආදායමෙන් සියයට 95 ක් සහ වෙනත් ආදායම්වලින් සියයට 75 ක්ද රැස් කරගෙන තිබුණි.

**2.2.3 වරිපනම් බදු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල්කළ වරිපනම් හා බදු රු.16,678,867 කින් වර්ෂය තුල සියයට 57 කට සමානව රු. 9,469,016 ක් පමණක් රැස්කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාවේ සමස්ත වරිපනම් බදු හිඟය රු.22,037,333 ක් වූ බැවින් වරිපනම් රැස් කිරීම් සතුටුදායක මට්ටමක නොපැවතුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.42,191,155 ක් හා මුද්දර ගාස්තු රු.148,362,254 ක් විය.

**3 . මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ 2017 දෙසැම්බර් 31 දින වන විට කාරණා 13 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) කර්තව්‍යයන් ඉටුනොකිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද හා ගිවිසුම් අත්සන් කරන ලද රු.158,316 ක් වූ කර්මාන්ත දෙකක් වර්ෂය අවසන් වන විටත් ඉටුකර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් සියයට 37 ක් ඉතිරි කර තිබුණි.

**(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභා බල ප්‍රදේශය තුල දෛනිකව එකතුකරන කසළ වලින් වැඩි ප්‍රමාණයක් කොම්පෝස්ට් අංගනය වෙත යොමුකර තිබූ අතර මාසිකව කොම්පෝස්ට් කි.ග්‍රෑ. 883 ක් පමණ නිෂ්පාදනය කර තිබුණි. කොම්පෝස්ට් අලෙවියෙන් වාර්ෂිකව රු.500,000 ක පමණ ආදායමක් උපයා තිබුණු අතර සමස්ථයක් ලෙස ගත්විට සභාව පරිසර හිතකාමී අයුරින් කසළ කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබුණි.

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක**

"තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ මූලික පියවරයන් සභාව විසින් ආරම්භ කර තිබූ අතර, එහිදී ජංගම සේවා පැවැත්වීම, මානව සම්පත් කළමනාකරණය, සේවක අභිප්‍රේරණය මෙන්ම මං මාවත් සංවර්ධනය ඇතුළු මහජන යටිතල පහසුකම් කෙරෙහි අවධානය යොමු කර තිබුණි. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන තිබුණද දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍යවන නිර්නායක සභාව විසින් හඳුනාගෙන නොතිබුණි.

## 4. කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1994 අංක 03 දරන මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තියේ (වයඹ පළාත්) අංක 2හි සඳහන් පරිදි එකතු කරන ලද වර්ෂයේ දෙසැම්බර් 31 දින සිට වර්ෂ 05 ක කාල සීමාවක් ඇතුලත සභාව විසින් ඉල්ලුම් නොකිරීම හේතුවෙන් 1991 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා රු.14,970,932 ක් වූ මුද්දර ගාස්තු සභාවට අහිමි වී තිබුණි.

(ආ) 2002 වර්ෂයේදී ගෝ ඝාතකාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට පුද්ගලයින් 04 දෙනෙකුට ගෙවන ලද රු.600,000 ක අත්තිකාරම් අයකර ගැනීමට 2018 මාර්තු 20 දින වනවිටත් සභාව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) සතිපොල බදු දීම, වරිපනම් සහ කඩකුලී වශයෙන් 2001 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා පුද්ගලයින් 04 දෙනෙකුගෙන් ලබාගත් රු.502,397 ක් වටිනා චෙක්පත් අඟරු වී තිබුණු අතර, එම මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරණ චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව යටත් පිරිසෙයින් වර්ෂ 5කට වරක් කඩ කුලී තක්සේරු කරවා ගත යුතු වුවද, 2006-2012 දක්වා කාලය තුල බදු දී තිබුණු ඇතැම් කඩ කාමර වෙනුවෙන් 2008 වර්ෂයේ තක්සේරු මුදල 2017 වර්ෂය දක්වාම අයකර තිබුණි.

**4.1** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-------------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත කාර්ය මණ්ඩලය 223 ක් වුවත් 247 ක් සේවයේ යෙදවීම හේතුවෙන් 24 ක සේවක අතිරික්තයක් පැවතුණි.

(ආ) විධායක කාර්යය මණ්ඩලයට අයත් ලේකම් තනතුර වර්ෂ 08 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

**4.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මාරවිල සුපිරි වෙළඳ සංකීර්ණයේ නාත්තන්ඩිය විවිධ සේවා සමුපකාර සමිතිය විසින් ලබාගත් කඩකාමරයක් වෙනුවෙන් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) මාරවිල සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 12ක මාස 03 ත් මාස 08ත් අතර කාලයක සිට හිඟව පවතින කඩකාමර කුලී රු.111,954 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 7 වන ඡේදයට පටහැනිව හාල්පන්විල වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයක් සභා අනුමැතියකින් තොරව අතුරු බදු දී තිබුණි.

(ඇ) හාල්පන්විල වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයක 2013 අප්‍රේල් සිට 2016 ජුනි දක්වා කාලපරිච්ඡේදයට අදාල හිඟ කඩකුලී රු.36,960 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 67 පරිදි 2017 වර්ෂය සඳහා පවත්වා තිබුණු සමීක්ෂණයෙන් හඳුනා ගෙන තිබුණු වෘත්තීන් සහ ව්‍යාපාර 14 ක් සඳහා රු.25,800 ක් වූ ගාස්තු අයකර ගෙන නොතිබුණි.

**4.3** **මතභේදයට තුඩුදුන් ගණුදෙනු**

**--------------------------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (එ) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා සේවකයින්ගේ සුභසාධනය හෝ රෝගාතුර වූ විට, ණයගැති වූ විට හෝ ආපදාවලට මුහුණ පෑ විට ඔවුන්ට සහන සැලැස්වීම හෝ සහය වීම පිණිස සංස්ථාපනය කරන ලද හෝ පිහිටුවන ලද යම් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් සඳහා නියම කරනු ලබන සීමා කිරීම්වලට යටත්ව, ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරනු ලබන මුදලක් ගෙවිය හැකිය. සභාව විසින් සෑම වර්ෂයකම රු.100,000 බැගින් මෙම සුභ සාධන අරමුදලට බැරකර තිබුණු නමුත් ඉහත අරමුණු ඉටුකරගෙන නොතිබුණි.

**4.4** **හඳුනාගත් පාඩු**

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන මහවැව මාළු කඩය, ඌරුමස් කඩය සහ ගව හා එළුමස් කඩවලින් විදුලිය හා ජලය සඳහා අය නොකර පොදු සැපයුමකින් ජලය හා විදුලිය ලබා දී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ජල ගාස්තු රු.14,935ක් සහ විදුලි ගාස්තු රු.19,948ක් සභාව විසින් ගෙවා තිබුණි.

(ආ) පළුවැල්ගාල මිනීමිටිය කොළණිය පාරට තාර දැමීම කර්මාන්තයේ නිම් වැඩ වටිනාකම වූ රු. 826,977 ක් වෙනුවට රු. 870,503 ක් ගෙවීම නිසා රු. 43,526 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

**05.** **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

| **පද්ධතිය** | **අඩුපාඩුව** |
| --- | --- |
| (අ ) ස්ථාවර වත්කම් | (i) ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණ සිදුකර නොතිබීම.<br>(ii) පරිගණක උපාංග ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ආ ) ණයගැතියෝ | පැරණි ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ ) ණයහිමියෝ | පැරණි ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) සේවක ණය | හිඟහිටි සේවක ණය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඉ ) අයවැය | කාලීන අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබීම. |